# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1835/9 - 2013 නොවැම්බර් මස 05 වැනි අඟහරුවාදා - 2013.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති හා නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයන්හි විස්තර කර ඇති ඉඩම් කොටස් බත්තරමුල්ල, වෝටර්ස් ඒජ් හෝටලය සඳහා පවතින ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීම පිණිස වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස් අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය I

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය තුළ, බත්තරමුල්ල පොල්දූව පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 1168 හා 1998.06.16 දින දරන සැලැස්මේ කැබලි අංක 2 (කොටසක්) හා කැබලි අංක 3, 4, 5 හා 6 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1498 (අක්. 0, රූඩ් 1, පර්. 19.20) විශාල පහත මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස් 5.

**1. කැබලි අංක : 2 (කොටසක්) විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0856 (අක්. 0, රූඩ් 0, පර්. 33.82)ක් පමණ වූ ඉඩම් කොටස**

| | |
|---|---|
| උතුරට | : මු. පි. කො. 5442හි කැබලි අංක 8 ; |
| නැගෙනහිරට | : මු. පි. කො. 2982හි කැබලි අංක 1 හා සැලැස්මේ කැබලි අංක 2හි කොටසක් ; |
| දකුණට | : මු. පි. කො. 2982හි කැබලි අංක 1 හා සැලැස්මේ කැබලි අංක 3 ; |
| බටහිරට | : මු. පි. කො. 5442හි කැබලි අංක 8. |

උපලේඛනය I (සම්බන්ධිතයි)

**2. කැබලි අංක : 3 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0215 (අක්. 0, රූඩ් 0, පර්. 8.50)ක් පමණ වූ ඉඩම් කොටස**

උතුරට : මෙම සැලැස්මේ කැබලි අංක 2 ;
නැගෙනහිරට : මෙම සැලැස්මේ කැබලි අංක 2 මු. පි. කො. 2982හි කැබලි අංක 1 ;
දකුණට : මෙම සැලැස්මේ කැබලි අංක 4 මු. පි. කො. 5442හි කැබලි අංක 8 ;
බටහිරට : මු. පි. කො. 5442හි කැබලි අංක 8.

**3. කැබලි අංක : 4 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0284 (අක්. 0, රූඩ් 0, පර්. 8.50)ක් පමණ වූ ඉඩම් කොටස**

උතුරට : මු. පි. කො. 2982හි කැබලි අංක 1 ;
නැගෙනහිරට : සැලැස්මේ කැබලි අංක 5 ;
දකුණට : මු. පි. කො. 5442හි කැබලි අංක 8 ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 3.

**4. කැබලි අංක : 5 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0023 (අක්. 0, රූඩ් 0, පර්. 0.91)ක් පමණ වූ ඉඩම් කොටස**

උතුරට : මු. පි. කො. 2982හි කැබලි අංක 1 ;
නැගෙනහිරට : සැලැස්මේ කැබලි අංක 6 ;
දකුණට : සැලැස්මේ කැබලි අංක 7 ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 4.

**5. කැබලි අංක : 6 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0120 (අක්. 0, රූඩ් 0, පර්. 04.74)ක් පමණ වූ ඉඩම් කොටස**

උතුරට : මු. පි. කො. 2982හි කැබලි අංක 1 ;
නැගෙනහිරට : මාර්ගය ;
දකුණට : මු. පි. කො. 5442හි කැබලි අංක 11 ;
බටහිරට : සැලැස්මේ කැබලි අංක 5.

උපලේඛනය II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ, බත්තරමුල්ල පොල්දූව පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජේ. බී. විජයකෝන් මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 482 හා 2000.07.24 දින දරන සැලැස්මේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන පර්. 2.45 විශාල පහත මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස.

උතුරට : බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර මහතාගේ අංක 1168 හා 1998.06.16 දින දරන සැලැස්මේ කැබලි අංක 6 ;
නැගෙනහිරට : මාර්ගය (මු. පි. කො. 7612හි කැබලි අංක 6) ;
දකුණට : මු. පි. කො. 5442හි කැබලි අංක 11හි කොටසක් ;
බටහිරට : මු. පි. කො. 5442හි කැබලි අංක 11හි කොටසක්.

11-714

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.